# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2303/04 - 2022 ඔක්තෝබර් මස 25 වැනි අඟහරුවාදා - 2022.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 08**

2013 නොවැම්බර් මස 11 වැනි දිනැති අංක 1836/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2022 ඔක්තෝබර් මස 13 වැනි දින.

I කොටස

| | | |
|---|---|---|
| සංශෝධන අංක 01 | - | 2014 නොවැම්බර් මස 05 වැනි දින හා අංක 1887/21 *අතිවිශේෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 02 | - | 2015 මාර්තු මස 09 වැනි දින හා අංක 1905/7 *අතිවිශේෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 03 | - | 2017 පෙබරවාරි මස 17 වැනි දින හා අංක 2006/53 *අතිවිශේෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 04 | - | 2017 දෙසැම්බර් මස 12 වැනි දින හා අංක 2049/14 *අතිවිශේෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 05 | - | 2019 අගෝස්තු මස 28 වැනි දින හා අංක 2138/27 *අතිවිශේෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 06 | - | 2020 අගෝස්තු මස 25 වැනි දින හා අංක 2190/26 *අතිවිශේෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 07 | - | 2021 ජුනි මස 23 වැනි දින හා අංක 2233/27 *අතිවිශේෂ ගැසට් පත්‍රය* |


1A - G 37860 — 08 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

II කොටස

7.3.1.2 සුදුසුකම් ;

සුදුසුකම් සපුරා තිබිය යුතු බවට ගැසට් නිවේදනයේ සඳහන් දිනට පහත (i), (ii), (iii), (iv) හා (v) වගන්ති යටතේ සඳහන් සුදුසුකම් වලින් එකක් සමග 2017 අංක 04 දරන පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සංස්ථාගත හෝ ආශ්‍රිත ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම.

(i) නොවෙනස්ව පවතී.

(ii) නොවෙනස්ව පවතී.

(iii) නොවෙනස්ව පවතී.

(iv) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු ලෙස වසර 21කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිතව එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර තිබීම.

(v) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයට අයත් නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකු හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ තනතුරක සේවය කරනු ලබන නිලධාරියෙකු ලෙස වසර 15කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම; සහ

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක, එම කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති බඳවා ගනු ලබන විෂය ධාරාව යටතේ වසර 04ක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර උපාධියක් ලබා තිබීම;

හෝ

(ආ) 7.3.1.2 (v) (අ) හි දැක්වෙන උපාධි පාඨමාලාවට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ, අධ්‍යාපන හා අනෙකුත් සියළු අවශ්‍යතා බඳවා ගනු ලබන විෂය ධාරාව යටතේ සම්පූර්ණ කර ඊට අදාළ වලංගු සහතිකයක් ලබා තිබීම.

***සටහන*** : ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවෙහි 07 වන සංශෝධනය *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ දින සිට වසර 03ක් දක්වා එනම් 2024.06.23 දින දක්වා සීමිත ධාරාව යටතේ නිලධාරීන් බඳවා ගැනීමේ දී "2017 අංක 04 දරන පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සංස්ථාගත හෝ ආශ්‍රිත ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම" යන අවශ්‍යතාවය සලකා බලනු නොලැබේ. කෙලෙස වුවද 2024.06.23 වැනි දින දක්වා බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් බඳවා ගනු ලබන දින සිට වසර 03 ක් තුළ අදාළ අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ යුතු අතර අදාළ කාලය තුල එම අවශ්‍යතාවය සම්පූර්ණ නොකරන නිලධාරීන්ගේ 03 වන වැටුප් වර්ධකය එම අවශ්‍යතාවය සම්පූර්ණ කරන දිනය තෙක් අත්හිටුවීමට කටයුතු කරනු ලැබේ.

10.3.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i), (ii), (iii), (iv) සහ (v) (අ) නොවෙනස්ව පවතී.

(v) (ආ) මාස 09කට නොඅඩු පාඨමාලා කාලයක් සහිත ඉංජිනේරු ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා / පශ්චාත් උපාධි සම්පූර්ණ කිරීම හෝ කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකය ලබා තිබීමත් සමග වරලත් ඉංජිනේරු තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබීම.

10.3.2 උසස් කිරීමේ ක්‍රමය ඃ

10.3.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව සෑම වසරකම ජූලි මස 01 හා ජනවාරි මස 01 වැනි දිනට පවත්නා පුරප්පාඩු අනුව 11.3 (ඈ) වගන්තියෙහි සඳහන් ආකාරයට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

සටහන යටතේ ඇති කරුණු එලෙසම පවතිනු ඇත.

11.3 තෝරාගනු ලබන ක්‍රමය

(අ) නොවෙනස්ව පවතී.

(ආ) නොවෙනස්ව පවතී.

(ඇ) නොවෙනස්ව පවතී.

(ඈ) විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු ඃ
විශේෂ ශ්‍රේණියේ පවත්නා තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පරිපාලන බලධාරියා විසින් තනතුරු පුරප්පාඩු ප්‍රසිද්ධියට පත්කර I ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවා, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 70ට අනුකූල වන සේ පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්, ජ්‍යෙෂ්ඨතාවය මත පදනම්ව ඉහත 10.3.2 හි සඳහන් විධිවිධාන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කර, අයදුම්කරුවන් ඉල්ලුම්කර ඇති තනතුරුවලට ඔවුන්ගේ මනාපයේ අනුපිළිවෙල සැලකිල්ලට ගෙන ජ්‍යෙෂ්ඨතමයාට ප්‍රමුඛතාවය ලැබෙන පරිදි එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්ම ඒ ඒ තනතුරුවලට පත්කිරීමට කරනු ලබන නිර්දේශ අනුව තනතුරු සඳහා පත් කරනු ලැබේ.

EOG 10 - 0219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.